# දුක් ගැහැට අමතකවන බක්මාසය

1 වන පිටුවෙන්

ශ්‍රීලංකාවේ පළාත්පාලන ආයතන 234 ක මැතිවරණ අවසන් වූ බව අපි යට සඳහන් කළෙමු. ලෝක ක්‍රිකට් කුසලාන නිමිත්තෙන් කල් දැමූ පළාත්පාලන 16 ක සහ විවිධ අධිකරණ නියෝගයන් මත කල්තැබූ ආයතන 64 ක මැතිවරණයන් මේ අප්‍රියෙල් මස අගදී හෝ මැයි මාසයේදී හෝ පැවැත්වෙනවා යයි සිතේ. කොළඹ, කෝට්ටේ, දෙහිවල ගල්කිස්ස හා කොලොන්නාව වැනි ප්‍රදේශවල පළාත් පාලන ආයතන අහෝසිකොට විශේෂ අධිකාරියක් යටතේ පාලනය කිරීමටද රජයේ අවධානය යොමුව ඇත.

## වෙල්වනායගම්ගේ පෙඩරල් පක්ෂය යළි හිස ඔසවයි

උතුරේ සහ නැගෙණහිර පෙදෙස්වල බොහෝ පාලන ආයතන දිනාගන්නා ලද්දේ **ITAK** නාමය යටතේ තරඟකළ **TNA** හෙවත් ද්‍රවිඩ එක්සත් සංධානයේ ආධාරකරුවන් විසිනි. **ITAK** යනු Ilankai Thamil Arasu Kachchi යන්නෙහි කෙටි යෙදුමයි. සිංහලෙන් එහි අදහස ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයයි. ඒ තමිල් අරසු කච්චි පක්ෂය පෙඩරල් පක්ෂය යනුවෙන් ද ප්‍රසිද්ධ වූ අතර, එය නිර්මාණය කළේ මියගිය කන්කසන්තුරේ හිටපු මන්ත්‍රී එස්. ජේ. වී. චෙල්වනායගම් විසිනි. රට බෙදිය යුතුය, උතුරේ දෙමළ අයට වෙනම නිජ බිමක් අවශ්‍යය යන දෙමළ නිජබිම් සංකල්පය මුලින්ම ගෙන ආවේ ඔහුය. මෙවර ද්‍රවිඩ එක්සත් සන්ධානය තම නමින් පෙනී නොසිට **තමිල් අරසු කච්චි** පක්ෂය යටතේ පළාත්පාලන මැතිවරණයට ඡන්දය ඉල්ලුවේ ඇයි? ඒ වෙන කිසිවක් නිසා නොව මෙම පළාත්පාලන මැතිවරණයෙන් ඔවුන් උතුරු නැගෙණහිර ලබන ජයග්‍රහණය තුළ එහි ජනතාව වෙනම රාජ්‍යයක් තවමත් ඉල්ලා සිටින බව ප්‍රකාශවෙන බව ලෝකයාට කියන්නටය. ඉන්පසු යළිත් උතුරේ රට දෙකඩකිරීම සඳහා ඉදිරි වැඩපිළිවෙල සකස්කර ගැන්මටය. මෙය අපේ දේශපාලකයින්ට තේරුණාදැයි නොදනිමි. කෙසේ වෙතත් ශ්‍රීලංකා රජය සහ දකුණේ ජනතාව මේ බව හොඳින් වටහාගත යුතු ය.

## මහින්ද මැජික්

පළාත්පාලන මැතිවරණයේදී ඡන්දය දෙන්නට එන ජනයා සැහෙන්න අඩුවනු ඇතැයි ද රජයට විශාල පරාජයක් අත්වනු ඇතැයිද ඇතැම් දෙනා සිතුවත් ඡන්ද ප්‍රථිඵල ප්‍රකාශ කළවිට පැහැදිලිවම පෙනුණේ රජයට විශාල ජයක් අත්වූ බවයි. සමහර පුවත්පත් ප්‍රකාශ කළ පරිදි තවමත් මහින්ද රාජපක්ෂගේ මැජික් වැඩකරනවා විය හැකි ය. එසේම රජය කෙරෙහි ගැමි ජනතාව තබා ඇති විශ්වාසය එලෙසම නොකැඩී පවතින බවද පිට පළාත්වල ඡන්ද ප්‍රථිපල වලින් දිස්වේ. සමහරු කියන්නේ නගරයේ ප්‍රශ්න ගමට නැති බවය. ඇතැම් නගරවල ඡන්දවිමසීම් රජය විසින් පසුවට කල්තබන ලද්දේ ඒ නිසායයි ද තවත් මතයකි. එසේ නම් එය ඉදිරි මැතිවරණවලදී පැහැදිලි වෙනවා ඇත.

## කොළඹ සුද්ධකිරීම

මේ මෑතක ඇරඹූ කොළඹ නගරය නවීකරණය කිරීම දිගටම සිදුවෙමින් පවතී. දැනට කොම්පඤ්ඤ වීදියට අළුත් මුහුණුවරක් දෙමින් ඇත. කලින් ඒ ප්‍රදේශයේ අනාදිමත් කාලයක් පුරා පැවති ලෑලි ටකරන් සහ පැල්පත් මුඩුක්කු නිවාස කඩා දමා සුද්ධ පවිත්‍රකර ඇති අතර එහි සිටි නිවැසියන් නියම නව නිවාස සංකීර්ණයක පදිංචිකරවා ඇත. මෙහිදී දේශපාලන වාසි ලබනු සඳහා ඇතැම් විපක්ෂයේ දේශපාලකයින්ගෙන්ද විවිධ මැරවර පුද්ගලයින්ගෙන්ද ජනතාවට උන්හිටි තැන් නැතිකරනවායයි චෝදනා නැගෙන්නට වූ නමුත් එය පැවතියේ සුළු කාලයකි. තමනට යහපතක්ද කොළඹ නගරයට ඉන් එළියක් වැටුණු බවද දැන් කොම්පඤ්ඤ වීදියේ ජනතාව දනිති.

මේ දෙයම බොරැල්ල මංසන්ධිය ගැනද කිවහැකිය. දැනට අවුරුදු අටකට පමණ පෙර බොරැල්ලේ වූ තදබදය හා අපිරිසිදුකම අපට මතකය. පාරේවත් පදික වේදිකාවේවත් ජනතාවට ගමන් කළ නොහැකි, එහෙන් කාර්, මෙහෙන් කාර් දුවන තත්වයක් තිබුණි. බොරැල්ලට නව මුහුණුවරක් දෙන්නට පටන්ගන්නවාත් සමග ඒ අවට වනාතමුල්ලේ මැරවරයෝ එයට එරෙහි වූහ. එහෙත් රජය ඔවුන් මර්දනයකර, එළවා දමා බොරැල්ල නවීකරණය කිරීම දිගටම ගෙන ගියේය. අද එහි ප්‍රථිපල අපි දකිමු. අද එය මගීන්ට ක්‍රමවත්ව ගමන්කිරීමට හැකි, ඉඩකඩ සහිත, තදබද නැති, නවීන බොරැල්ල හංදිය බවට පත්ව ඇත. ජනතාව අද එහි අලංකාරය දකිති.

ඉතා ජනාකීර්ණව දුගඳ හමන, මඩගොහොරුවක්, අපායක් බවට නිතර පත්වන පිටකොටුවේ එළවළු හා මාළු මාර්කට් ද මේ නවීකරණය මත වෙනත් තැන්වල ස්ථානගත කරන බව ඇසේ. දැනටම පිටකොටුවේ සාන්ත ජෝන් මාළු වෙළඳ සැල පෑලියගොඩ අළුතින් තනන ලද නවීන වෙළඳ සංකීර්ණයකට ගෙන ගොස් ගිය සතියේ විවෘත කරනු ලැබීය. එහි තොගවෙළඳාම සඳහා කුටි 148 ක්ද, සිල්ලර විකුණුම් සඳහා වෙළඳ කුටි 125 ක්ද අළුතින් තනා ඇත. නවීන ශීත ගබඩාද වෙති. මෙය අපට ලන්ඩනයේ බිලිංග්ස්ගේට් මහා මාළු වෙළඳ සංකීර්ණය සිහි ගන්වයි. මේ පෑලියගොඩ මාළු හලේ සේවක පිරිස් එහි පවිත්‍රතාවය තහවුරුකරනවා ඇතැයි සිතමු. නැත්නම් එය පරණ අපාය බවටම යළිත් පත්වනු ඇත.

කොළඹ නාගරිකයේ මේ වෙනස්කම් සියල්ල සිදුවනුයේ ආරක්ෂක ලේකම් ගොඨාභය රාජපක්ෂ මහතාගේ අනුදැනීම යටතේය. ඔහු කොළඹ දියුණුකරන ව්‍යාපෘතියකට අතගසා තිබීම සතුටුදායක කාරණයකි. එහි සුබදායක ප්‍රථිපල දැනටම දක්නට ඇත.

## වර්ල්ඩ් කප් එකට මුවාවී පැට්‍රල් ඩීසල් ගෑස් මිළ නගී

කලින් ලැබුණු ආරංචි අනුව රජය සූදානම්ව සිටියේ පළාත්පාලන ඡන්දයෙන් පසු තෙල් මිළ වැඩිකරන්නට ය. ඔවුන්ට ඒ සඳහා සුදුසුම අවස්ථාවක් උදා වූයේ ය. එනම් ක්‍රිකට් ලෝක ශූරතා කුසලාන අවසන් මහා තරඟයට ශ්‍රීලංකා පිළ තේරීම පමණක් නොව ශ්‍රීලංකාව නිසැකවම දිනන බවට රජයේ ද ජනතාවගේ ද විශ්වාසය ඇතිවීමයි. ජ්‍යෝතිශ්‍ය ශාස්ත්‍රඥයින් ද එය ස්ථිරකර තිබිණ. අවසන් තරඟයේ දිනය අප්‍රියෙල් 2 වන දා ය. පවතින තත්වය ප්‍රයෝජනයට ගනිමින් අප්‍රියෙල් 1 වන දා මධ්‍යම රාත්‍රියේ ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව පැට්‍රල් ද, ඩීසල් ද, ගෑස් ද වැඩිකළා ය.

පැට්‍රල් ලීටරයක මිළ රු:10 කින්ද, ඩීසල් ලීටරයක් රු:7 කින්ද, භූමිතෙල් ලීටරයක මිළ රු:10 කින්ද ගෑස් සිලින්ඩරයක මිළ රු: 238 කින් වැඩිකර තිබේ. දැන් පැට්‍රල් ලීටරයක් රු:125 කි. ඩීසල් ලීටරයක මිළ රු:76 කි. භූමිතෙල් ලීටරයක මිළ රු:61 කි. ගෑස් සිලින්ඩරයක මිළ රු:1890 කි.

ශ්‍රීලංකා රජය විසින් කරන ලද මෙම ඉන්ධන මිළ වැඩිකිරීම ඒජාපය ප්‍රමුක විපක්ෂයේ දැඩි විවේචනයට දැන් ලක්ව ඇත. ඔවුන් රජයට චෝදනාකරන්නේ රාජපක්ෂ රජය ක්‍රිකට් උණුසුමට මුවාවී ජනතාව රවටමින් වංචනික ලෙස මෙම මිළ වැඩිකිරීම් කළ බවයි. තෙල් මිළ වැඩිවීම් සමග හෙට අනිද්දා බස් ගාස්තු, ජල බිල, විදුලි බිල, කිරි පිටි ඇතුළු සියළු පාරිභෝගික ද්‍රව්‍ය වල මිළ ඉහළ දැමීමටත් රජය සැළසුම් කරනවායයි ඔව්හු කියති.

එයට පිළිතුරු වශයෙන් රජය කියන්නේ විපක්ෂය නිකරුණේ ජනතාව බියවද්දන බවයි. ඉන්ධන මිළ ඉහළ දැමීමට සිදුවූයේ දැනට පවතින මැද පෙරදිග ගැටුම් නිසා මතුවූ තෙල් අර්බුදය නිසා බවයි. ඒ කියමනෙහි කිසියම් සත්‍යතාවක් ඇති බව මධ්‍යස්ථ සිතින් බලන විට පෙනේ. දැනට යුරෝපයේ රටවලටද මේ තත්වයම බලපා ඇති අතර ඒ රටවල ද පැට්‍රල්, ඩීසල් හා ගෑස් මිළ ඉහළ ගොස් ඇති බව අද අපි දකිමු.

ලෝක කුසලානය අප ජයගැනීමත්, තෙල් මිළ ඉහළ යෑමත් එක විට සිදුවූවේ නම් අප රටේ ජනතාවට එය එතරම් ලොකු ගැටළුවක් නොවන්නට තිබුණි. එහෙත් අවසන් තරඟයෙන් අප පරාජය වී, බලාපොරොත්තු සුන්වී, දුකට පත්වෙද්දී, තෙල් මිළ ද ඉහළයාම ජනතාවට තදින් දැනෙන කාරණයක් බවට පත්ව ඇත.

කරුණු කාරණා කුමක් වුවද තව දින දෙක තුනකින් අප දේශය සිංහළ අලුත් අවුරුද්දට මුහුණ දෙති. කුමන දුකක් කරදරයක් වුවද ඒ සියල්ල සිනාමුසු මුහුණින් ඉවසීම අප ජනතාව සතු ඉතා උත්කෘෂ්ට ගුණයකි. අප රටට ජනතාවට සුබ අලුත් අවුරුද්දක් වේවායි ඉත සිතින් පතමු!

## සිංහ නාද !

*ශ්‍රීලංකා පිලේ සුපිරි ක්‍රීඩක තිලකරත්න දිල්ෂාන් ඉන්දීය පිතිකරු විරාත් කෝලිට පන්දු යවා කෝලිගේ පිත්තෙන් නික්මුණු උඩ පන්දුවක් රැයක වේගයෙන් ගුවනට පැන චමත්කාර ලෙස රැක ගෙන කෝලි දවාලූ අවස්ථාවේ ශ්‍රීලංකා පිලේ නායක කුමාර් සංගක්කාර ඇතුළු සෙසු සහෝදර ක්‍රීඩකයින් ඔහු වටා රොක්වී ඒ ජය ඒ පිටියේත් ලොව පුරා එය නරඹන මිලියන ගණනක් ප්‍රේක්ෂකයින්ටත් ප්‍රදර්ශණය කළ ආකාරයයි මේ.*

*ශ්‍රීලංකාව පරාජය වූ බව සැබෑ නමුත් ලංකා පිළ ඉන්දීය පිළට වඩා හැම අතින්ම හොඳ බව බොහෝ අය කියති.*



# පළාත් පාලන ආයතන කොයිබටද?

පළාත් පාලනය Local Government යනු රටක මධ්‍යම ආණ්ඩු පාලනයකින් තොරව ඒ ඒ නාගරික හෝ ගම් ප්‍රදේශවල කටයුතු ක්‍රමානුකූලව ඉටුකරලීමේ ක්‍රියාදාමයයි. මහා බ්‍රිතාන්‍යයේ පලාත්පාලන ආයතන City Council, District Council සහ Town Council යනුවෙන් හැඳින්වේ. මීට අමතරව කුඩා ප්‍රදේශ මායිම්කරගෙන ස්වේච්ඡා හා ආගමික සංවිධානවල මූලිකත්ව යෙන් Parish Councils ද පිහිටුවාගෙන ඇත. මේවා අධීක්ෂණය සඳහා විශාල ප්‍රාන්ත සභා County Councils ක්‍රියාත්මක වෙයි.

ශ්‍රීලංකාවේද මහ නගර සභා, නගරසභා සහ ප්‍රාදේශීය සභා වශයෙන් වර්ග තුනක් ඇත. මේවායේ අධීක්ෂණ බලය ඇත්තේ (Provincial Council) පළාත් සභාවටයි. ලෝකයේ පැරණිතම ගම් හා නගර පාලන ක්‍රමයක් ශ්‍රීලංකාවේ පණ්ඩුකාභය රජ දවස පැවති බව මහාවංශය සාක්ෂි දරයි.

බ්‍රිතාන්‍ය ජනජීවිතයේ අවශ්‍යතා වඩාත් ඉටුකර දෙන්නේ Council මගිනි. ඔවුන්ට මහ ආණ්ඩුව වෙත යාමට අවශ්‍ය නොවේ. සුබසාධක, සමාජසේවා, ක්‍රීඩාංගන පොදු පහසුකම්, පරිසර ආරක්ෂණය, නිවාස හා සබැඳි නීතිමය කටයුතු, කඩසාප්පු හා වාහන පාලනය වැනි දහසකුත් එකක් කාර්යයන් ඉටුකරන්නේ පළාත්පාලන ආයතන මගිනි. ඒ සඳහා කවුන්සිල් බදු ද අයකරයි.

ශ්‍රීලංකාවේද පළාත්පාලන ආයතන ව්‍යුහය ඉතා සාර්ථකව ක්‍රියාත්මක වෙමින් තිබිණ. නගර සභා, සුළුනගර සභාවලට අමතරව ගම්සභා ශ්‍රීලංකාවේ ජනතාව වඩාත් සමීප වූ අයතනයි. ඒවාට පත්වූ නියෝජිතයෝ ගෞරවණීය අවංක සේවයක් ඉටුකළෝය. 1959 දී කොළඹ නගරය දුටු සිංගප්පූරුවේ ජනාධිපති ලී ක්වාන් යූ ට අවශ්‍ය වූයේ කොළඹ නගරයේ පාලන රටාව සිංගප්පූරුවට හඳුන්වා දීමටය. නුවරඑළිය, මහනුවර ,බණ්ඩාරවෙල වැනි නගරවල මල්පාත්ති සකස්කොට ඉතා ප්‍රියමනාප මුහුණුවරක් දක්නට තිබිණ. එකල ඕනෑම නගරයකට ඇතුල්වන සීමාවේ නගරයේ නම, මුහුදු මට්ටමේ සිට උස සහ අයුබෝවන් හෝ සාදරයෙන් පිළිගනිමු යන දැන්වීම් පුවරු ප්‍රදර්ශණය විය.

ගම්සභාවේ සභාපති හෝ නගරයේ නගරාධිපති ප්‍රදේශයේ

**පළාත්පාලන ඡන්ද වේදිකාවේ ඔව්හු තම ගමේ නගරයේ ප්‍රශ්න ගැන කිසිවක් කතා නොකරති. ඒ වෙනුවට ජනාධිපතිගේ වැඩපිළිවෙල, විපක්ෂ නායකගේ ඉදිරිදැක්ම, උතුරේ යුද්ධය, ඇෆ්ගනිස්ථානයේ සහ ලිබියාවේ අර්බුදය ගැන දොඩවති.**

වැදගත් පුද්ගලයෙකු වූවා පමණක් නොව එම ගෞරව ය රැකීමට ද ඔව්හු සමත්වූහ.

පළාත්පාලන ආයතනවල කටයුතු කළ මහජන නියෝජිතයෝ පසු කලෙක සම්භාව්‍ය දේශපාලන නායකයෝ වූහ. ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා, එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක, ආර්. ප්‍රේමදාස, ජේ. ආර්. ජයවර්ධන, වී. ඒ. සුගතදාස, ඊ. එල්. සේනානායක ඉන් කීප දෙනෙකි. මීනා රත්නම්, විවියන් ගුණවර්ධන, අයේෂා රාවුෆ් වැනි කාන්තාවෝ පළාත්පාලන ආයතනවල නමක් තැබූ නියෝජිතවරියෝ වූහ. දැන් තත්වය එය නොවේ.

ලංකාවේ පළාත්පාලන මැතිවරණ නාමයෝජනා බාරදුන් දිනයේ සිටම එම ආයතනවල ගමන් මග කඩාවැටිණ. නාමයෝජනා ඉල්ලා ප්‍රධාන දේශපාලන පක්ෂ මූලස්ථානයන්හි විවිධ අරගල පටන්ගැනිණ. පක්ෂනායකයින්ට කරදරද, තර්ජන ද ඇතිවිය. එම නාමයෝජනා ලැයිස්තු සකස් කරන්නට පක්ෂවල ලේකම්වරුන්ට නොහැකි විය. සීයක් වැරදි තිබීම නිසා ප්‍රතික්ෂෙප විය. ඒවායේ අත්සන්ද සහතික කර නොතිබිණ. පළාත්පාලන ආයතන 64 කට මැතිවරණය අවලංගු විය.

ශ්‍රීලංකාවේ ජාතික දේශපාලනය පළාත්පාලන ආයතන වලට මුසුවීම ඛේදවාචකයකි. පළාත් පාලන මැතිවරණයේදී කිසිවෙකුත් ගමේ නගරයේ ප්‍රශ්න ගැන කතා නොකරති. ඒ වෙනුවට ජනාධිපතිගේ වැඩ පිළිවෙල, විපක්ෂනායකගේ ඉදිරිදැක්ම, උතුරේ යුද්ධය, රජයේ වැරදි වැඩ, විපක්ෂයේ ගැටළු, පමණක් නොව, ඇෆ්ගනිස්ථානයේ සහ ලිබියාවේ අර්බුදය ගැනද දොඩවති. එහෙත් කිසිවෙකුත් නගරයේ කැළිකසළ ඉවත්කිරීම, කානු සුද්ධකිරීම, ඩෙංගු රෝග මර්දනය, නගරයේ වාහන පාලනය, අයාලේ යන ගවයින් සුනඛයින් ගැන, කැඩුණු පාරවල් බෝක්කු ගැන කිසිවක් කතා නොකරති.

මැතිවරණයෙන් පසු සභාපති හෝ නගරාධිපති තෝරාගැනීමද කුලල් කාගන්නා තවත් අප්‍රසන්න තරඟයක් බවට පත්වේ. එහිදී පක්ෂ නායකත්වයට ඇති හිතවත්කම, ජ්‍යෙෂ්ඨකම හෝ තමා අරගෙන ඇති වැඩි මනාප ගණන ගැන වාද වෙති. කලහකර ගනිති.

හිනාවට කාරණා ද එමට ය. කොළඹ නගර සභාවට එක් අපේක්ෂකයෙක් ඉල්ලූ විට ඔහුගේ බිරිඳද වෙනත් පක්ෂයකින් ඉදිරිපත්වූවාය. එක වහල යට පවුල් කන මෙම යුවල පක්ෂ දෙකකට බෙදී ඡන්දය ඉල්ලීම පුදුම සහගතය. ලෝකයේ කිසිම තැනක නොවන දේ ලංකාවේ සිදුවේ.

මෙවර හපුතලේ නගර සභාවට මන්ත්‍රීවරු 9 ක් තෝරා ගැන්මේ තරඟයට ඉදිරිපත් වූ ජනතා විමුක්ති පෙරමුණට ලැබී තිබුණේ ඡන්ද 2 ක් පමණකි. ඒ පවුලේ අයවත් අපේක්ෂකයාට ඡන්දය දුන් බවක් නොපෙනේ. මුලතිව් දිස්ත්‍රික්කයේ නැගෙණහිර මාන්තෙයි ප්‍රාදේශීය සභාවට ඉල්ලූ එක්සත් ජාතික පක්ෂ අපේක්ෂකයාට ලැබී තිබුණේ ඡන්ද 3 ක් පමණකි. ඡන්දයක් ගන්න බැරි මිනිසුන් ඡන්ද ඉල්ලීම කාලය සහ මහජන මුදල් නාස්තියක් පමණි.

මහා බ්‍රිතාන්‍යයේ පළාත් පාලනයට වඩා වැදගත් තැනක් ලැබී ඇති අතර එයින් මහත් ප්‍රයෝජනයක්ද සැලසේ. 1931 දී ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ශ්‍රීලංකාවේ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ව්‍යුහය සැකසුනේ ලන්ඩන් නගර පාලන ආකෘතිය අනුවය.

ගමේ නගරයේ පාලනය ඒ පැත්තේ දේශපාලනයට බාරකොට එය ජාතික දේශපාලනයෙන් ඈත් විය යුතුය. මෙවර 2011 මැතිවරණය අවසන්වූයේ මිනීමැරුම් 6 ක් සහ ප්‍රචණ්ඩ ක්‍රියා දහස් ගණනකිනි. යහපාලනයක් සඳහා යහපත් පුද්ගලයෝ දේශපාලනයට පිවිසිය යුතුය. එසේ නොවන කල කාරණා මෙසේ ය !

♦ **මේජර් වී. බී. කරුණාරත්න**
**Major V. B. Karunaratne**
Ex Deputy Sergeant-At-Arms
of Sri Lanka Parliament
**Oxford - UK**